ChildLine Sri Lanka

1929



## "1929" ඔබේ හොඳම මිතුරා කරගන්න

දුවේ පුතේ, ඔබේ හොඳම මිතුරා 1929. ඔබට හෝ ඔබේ යාළුවෙකුට හෝ කාගෙන් හෝ අපයෝජනයක් වෙනවා නම් වහාම "1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය" අමතන්න. ඒ වගේම, කාටවත්ම කියා ගන්න බැරි, ඔබ තනිවෙලා යයි හිතෙන ඕනෑම වෙලාවක ඔබට සවන් දෙන්න.. ඔබගේ යහපත සලසමින් ළඟින් ඉන්න.. 1929 සූදානම් බවත් අමතක කරන්න එපා.


ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
අංක 330, තලවතුගොඩ පාර,
මාදිවෙල, ශ්‍රී ජයවර්ධනපුර.
දුරකථන - 011 2778911 - 12 - 14
ෆැක්ස් - 011 2778915
විද්‍යුත් තැපෑල - ncpa@childprotection.gov.lk
වෙබ් අඩවිය - www.childprotection.gov.lk






# ළමා ලෝකය ළමයින්ටමයි







## දැයේ ජීවය ඔබයි

ආදරණීය දුවේ, පුතේ, දැයේ වටිනාම සම්පත ඔබයි. උපන් දේශයේ අභිමානය රැකෙන්නට නම් ඔබද අභිමානවත් පුද්ගලයෙකු විය යුතුයි.

ඔබට එරෙහිව සිදුකරන අපයෝජනයන්ට විරුද්ධව නැගී සිටින්නට ඔබ තුළ මනා ශක්තියක් පැවතිය යුතුයි. ඒ සඳහාමයි අපයෝජනයන්ගෙන් ආරක්ෂා වන ආකාරය අපි ඔබට කියලා දෙන්නෙ...



## කවුද මේ ළමා අපයෝජන සිදු කරන්නේ ?

ඔබව අපයෝජනයට ලක් කරන පුද්ගලයා ඔබේ ළගම හිතවතෙකු හෝ ඥාතියෙකු වෙන්නත් පුළුවන්. ඒ වගේම ඔබ නොදන්නා කෙනෙකු වෙන්නත් පුළුවන්.

ඔබ සමාජයේ ජීවත්වනවිට විමසිලිමත්ව සිටීම ඉතා වැදගත්. ළමා අපයෝජන පිළිබඳවත් එවැනි දේ සිදු කරන පුද්ගලයින් පිළිබඳවත් ඔබේ දැනුවත් බව ඉතා වැදගත්.

## ළමා අපයෝජනය යනු

**පුංචි ඔබේ සෞඛ්‍යයට හා වර්ධනයට හානිකර හෝ හානි වීමට ඉඩ තිබෙන ඕනෑම දෙයක් කිසියම් කෙනෙකුන් විසින් සිදු කරන්නේ නම්, එය ළමා අපයෝජනයක් වනවා...**

ඔබ ශාරීරිකව මානසිකව ලිංගිකව අපයෝජනය කරන්න හෝ නොසලකා හරින්න මේ ලෝකේ කාටවත්ම අයිතියක් නැහැ. එවැනි හානියක් කවුරුන් විසින් හෝ ඔබට සිදු කරනු ලබනවා නම් ඊට විරුද්ධ වීමේ අයිතියක් ඔබට තිබෙනවා.

## ඔබ, ඔබේ ආරක්ෂාව වෙනුවෙන් ක්‍රියා කරන්න

අනාරක්ෂිත හෝ හුදෙකලා තැන්වල ගැවසීමෙන් වළකින්න.

අදාළ සිදුවීම ඔබට විශ්වාසවන්ත කෙනෙකුට කියන්න.

කිසියම් අවස්ථාවක අනාරක්ෂිත බවක් දැනේ නම් වහාම එම ස්ථානයෙන් ඉවත් වන්න.

කවුරුන් හෝ ඔබට අනිසි බලපෑම් එල්ලකරයිනම් ඊට ඔබේ අකැමැත්ත ප්‍රකාශ කරන්න.